# 2017 දෙසැම්බර් මස සාංඝික පවුල් දින සුපුවත

01. පුබුදු ගීතාංජලී ගී කිහිපයක් ගායනා කරමින් පරිසරය සූදානම් කරමු.
පුබුදු ගීතාංජලී 174, 178, 183, 184

02. ආරම්භක ප්‍රශංසාව - පුබුදු ගී අංක 03 "ආ එනු මැනේ ...."
ප්‍රශංසාවට හැඳින්වීම:

අපි ක්‍රිස්තුන් වහන්සේ තුළින් තෝරා ගත් සෙනඟක් වෙමු. එසේ වන්නේ දෙවියන් වහන්සේගේ පෙර නියම කරගත් සැලැස්ම ලෙස සියල්ල සිදු කරන ස්වකීය අභිප්‍රාය අනුවය. එබැවින් ක්‍රිස්තුන් වහන්සේ තුළින් ප්‍රථමයෙන් බලාපොරොත්තු ලැබූ අප, ඔවුන් වහන්සේගේ මහිමයට ප්‍රශංසා කළ යුතුය. (එපීස 1:11-12)

ඔබව/මාව තෝරා ගෙන, කැඳවා ගෙන, වෙන්කර ගනිමින් අපට දක්වා ඇති සුවිශේෂී ආදරය මුල් කරගෙන ද අප පිළිබඳ දෙවියන් වහන්සේගේ අභිප්‍රාය අප තුළ ඉටු කිරීම මුල් කරගෙනද අද දවසේ ප්‍රශංසාවට ඇතුළු වෙමු.

03. ප්‍රශංසාව තුළ අප අත්දුටු උත්ථානවූ සමිඳාණන් වහන්සේ පිළිබඳ අත්දැකීම කුඩා කණ්ඩායම් තුළ බෙදා ගන්න.

04. දවසේ සුපුවත:

(අ) ආගමන කාලය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?
එහි ඇති වටිනාකම කුමක්ද?
(ළඟ සිටින කිහිප දෙනෙකු සමඟ බෙදා ගන්න)

(ආ) පොදුවේ බෙදා ගැනීමට සලස්වන්න.

(ඇ) ආගමන කාලය යන්නෙන් අදහස් කරන්නේ පැමිණීම යන්නයි.

- අප ශුද්ධවූ කතෝලික සභා මාතාව ජනවන්දනා වර්ෂයේ විශේෂ මංගල්‍යය අවස්ථාවන්ට පෙර ඒ සඳහා සූදානම් වීමේ කාලයක් වෙන්කර ඇත. ජේසු සමිඳාණන්ගේ කුරුසියේ මරණය හා උත්ථානය සිහිපත් කරන පාස්කු මංගල්‍යයට පෙර දින 40ක සූදානම් වීමේ කාලය චතාරිකය හෙවත් කොරොස්ම සමය ලෙස හඳුන්වයි. එසේම ක්‍රිස්තුන් වහන්සේගේ උත්පත්තිය හෙවත් නත්තල් මංගල්‍යයට පෙර සති 4ක කාලය ආගමන සමය ලෙස හඳුන්වයි. මෙසේ සුවිශේෂී කාලයක් වෙන් කරමින් ශුද්ධවූ සභාව බලාපොරොත්තු වන්නේ ගැඹුරු සූදානමකින් යුතුව සැදැහැවතුන්ව එම මංගල්‍යයට යොමු කරවීමය.

- කතෝලික ජනවන්දනා වසරේ ආරම්භය ආගමන කාලයේ පළමු ඉරුදිනෙන් පටන් ගෙන ක්‍රිස්තු රජාණන්ගේ මංගල්‍යයෙන් අවසාන වෙයි.
- ක්‍රිස්තුන් වහන්සේගේ ආගමනයට හෙවත් පැමිණීමට සූදානම් වීමේ සති 4ක කාලයට අප දැන් පැමිණ සිටිමු. එය ත්‍රිවිධාකාර පැමිණීමක් සිහිපත් කරයි.

i ක්‍රිස්තුන් වහන්සේ කුඩා බිළිඳෙකු ලෙසින් ලෝකයට පැමිණීම හෙවත් පළමු නත්තල (බෙත්ලෙහෙමේ කිතු උපත) (ශු.ලූක් 2:1-7)

ii ඔවුන් වහන්සේ මහිමාලංකාරයෙන් දෙවන වර පැමිණීම එනම් අවසානයේ සියළු ජාතීන් විනිශ්චය කිරීමට පැමිණීම හෙවත් නව අහසක් නව පොළොවක් උදාවීමේ විශ්වයේ මහා නත්තල. (ශු.මාක් 13:33)
කිතු සමිඳුන්ගේ මහිමාන්විත දෙවන පැමිණීම කෙරෙහි කිතුනුවන්ගේ අවධානය යොමු කරන මෙම කාලය තුළ කිසිවකු නොදන්නා මොහොතක පැමිණෙන කිතු සමිඳුන් පිළිගන්නට අප අවදියෙන් සූදානම්ව සිටිය යුතු බව මතක් කර දෙයි.

iii නිරන්තරයෙන් අප වෙතට වඩින උත්ථාන වූ සමිඳාණන් වහන්සේගේ පැමිණීම.
දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ තුළින්, එකමුතුකම, එක්සිත්කම තුළ වැඩවසන සමිඳාණන් වහන්සේව හමුවීම තුළින්, එදිනෙදා ජීවිත සිද්ධීන් තුළින් හමුවන උත්ථානවූ සමිඳාණන් වහන්සේව අත්දැකීම.

ක්‍රිස්තුන් වහන්සේගේ පැමිණීම අළුත් උපතක ඇරඹුමයි. හැම මොහොතකම ඔවුන් වහන්සේව හමුවන තැනැත්තාට අළුත් උපතක් අත්දැකිය හැකිය. නත්තල යන වදනෙහි අර්ථය "උපත" යන්නයි. අළුත් උපතක් නොලබන නත්තල ඓතිහාසික සිදුවීමක් සිහිපත් කරන උත්සවයක් පමණක් විය හැකිය. සැබෑ නත්තල පරණ වූවක් නොවේ. පරණ ජීවිතය අතහැර අළුත් ජීවිතයක් ලබන හැම මොහොතක්ම නත්තලකි.

(ඉ) ඔබේ ජීවිතයේ නව උපතක් අත්දුටු අත්දැකීමක් කුඩා සංඝ තුළ බෙදා ගන්න.

(ඊ) ශු.ලූක් 1:8-20, ශු.ලූක් 4:16-19 කියවන්න.
නත්තල කාගේද? කා සඳහාද? බෙදා ගන්න.

නත්තල උත්සවයකි. ඒ අප සමග නතර වී සිටින සමිඳාණන් වහන්සේව හමුවෙමින්, අත්දකිමින් නව උපතක් අත්දකින, ප්‍රීතිය සමරණ උත්සවයකි. නමුත් වත්මන් සමාජය තුළ නත්තල වෙළෙඳුන්ගේ ග්‍රහණයට අප හසුකරන, වහල්බාවයට, නාස්තියට, අසහනයට, බාහිර ආටෝපයට ලක් කරන උත්සවයක් බවට පත්ව ඇත. සැබෑ නත්තල වහල්කම්වලින්, අසහනයන්ගෙන්, පාපයන් ගෙන් අප නිදහස් වන තැනයි. මේ නත්තලේදී අප අවදි වෙමු.

- මෙවර නත්තලේදී වෙළෙඳුන් අපව හසුකර ගන්නා විවිධ කූට උපායන්ට නොරැවටෙමු.
- පුහු ආටෝපය, බාහිරව අප සූදානම් වන විවිධ ක්‍රමවේදයන් ඇත්තටම දෙවියන් වහන්සේගේ කැමැත්ත දැයි විමසමු.
- පුබුදු ජනතාවක් ලෙසට අපට ලැබී ඇති වටිනාකම් අගය කරමු.

    * දිව්‍ය පූජාවට සූදු ඇඳීම.
    * අප ළඟ ඇති ටිකෙන් දුගීන් හා සාංඝික වෙමු.
    * අසරණව, රෝගීව, වයස්ගතව සිටින්නන් බැහැදකින්නට යමු.
      සරණ වෙමු.
    * රතිඤ්ඤා දැල්වීම වැනි ක්‍රියාවන්ගෙන් වළකිමු.
    * සම්ප්‍රදායික නත්තල් ගවලන, නත්තල් ගස වෙනුවට සැබෑ නත්තලේ අරුත හඟවන යමක් කළ හැක්කේ කෙසේදැයි සිතමු.
    * ක්‍රිස්තුන් වහන්සේ ලොවට ගෙනා විමුක්තියේ සුභාරංචිය අප රැගෙන යා යුත්තේ, සාක්ෂි දැරිය යුත්තේ කෙසේදැයි සිතමු.
    * ශ්‍රාවක සංඝයක් ලෙස අපට කළහැකි යම් දෙයක් පිළිබඳ අවදි වෙන්න.

05. ඒ සඳහා ශුද්ධාත්ම බලය පතා අවසන් යාච්ඤාවට ඇතුළු වන්න.

*******************